# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| දිනය Date | 2025.11.09 පැය 0535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 2020/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|


**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>**

### 01. පිස්තෝල වර්ගයේ ගිනි අවියක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - වත්තල පොලිස් ස්ථානය.

2025.11.08 වන දින උදෑසන කාලයේ වත්තල පොලිස් වසමේ අල්විස් ටවුන් හන්දිය ප්‍රදේශයේදී වත්තල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් පොලිස් අණ නොතකා ධාවනය කල කාර් රථයක් පසුපස හඹා ගොස් එම රථය නවතා පරීක්ෂා කිරීමේදී එම රථයේ රියදුරු අසුන යට සඟවා තිබූ පිස්තෝල වර්ගයේ ගිනි අවියක්, එම පතරොම් ගැබක් තිබී හමුවී ඇති අතර කාර් රථය හා එහි රියදුරු ලෙස සිටි පුද්ගලයා ගිනි අවියක් සන්තකයේ තබා ගැනීම හේතුවෙන් අත්අඩංගුවට ගෙන ඇත.

සැකකරුගෙන් සිදු කළ වැඩිදුර ප්‍රශ්න කිරීමේදී මෙම අවිය තවත් පුද්ගලයෙකුට ලබාදීමට රැගෙන යන බවට අනාවරණය වීම මත එම පුද්ගලයා ද වත්තල පොලිස් වසමේ මාබෝල ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරුවන් වයස අවුරුදු 33 ක් වන යාපනය ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

වත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

### 02. හෙරොයින් සමඟ සැකකරුවන් පස්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුර.

2025.11.07 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා ජයවර්ධනපුර කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරකට අනුව ගොඩගම තෙල්වත්ත ප්‍රදේශයේදී **හෙරොයින් කිලෝ 05 ග්‍රෑම් 416 ක්** සමඟ සැකකරුවෙකු හා ඊට ආධාර අනුබල දුන් සැකකරුවන් පස් දෙනෙකු මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයා ගත් බවට සැකකරන මුදල් රුපියල් 10,811,500 ක මුදලක් සමග අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත භාරදී ඇත.

**සැකකරුවන් අවුරුදු 32 ත් 51 අතර වයස්වල පසුවන ගාල්ල,අහංගම,තෙල්වත්ත, වතුගෙදර සහ සීනිගම ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. දියේ ගිලී දරුවෙකු මියයාම - සීගිරිය පොලිස් වසම.**

2025.11.08 වන දින සවස් කාලයේ සීගිරිය පොලිස් වසමේ අවුඩංගාව ප්‍රදේශයේ පිහිටි හෝටලයක පිහිනුම් තටාකයක ගිලී දරුවෙකු දඹුල්ල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත සීගිරිය පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 05 ක් වූ දළුගම, කැළණිය ප්‍රදේශයේ පදිංචි දරුවෙකි.**

මෙම දරුවා දෙමව්පියන් සමඟ පිහිනුම් තටාකයේ දියනාමින් සිටියදී මෙසේ අනතුරට පත්ව ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සීගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04. මාරක රිය අනතුරක් - මාතලේ පොලිස් වසම.**

2025.11.08 වන දින සවස් කාලයේ මාතලේ පොලිස් වසමේ මහනුවර යාපනය මාර්ගයේ දියබුබුල පාලම අසලදී මාතලේ දෙස සිට ඇල්වල දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථයක් මාර්ගය හරහා ගමන් කල පදික පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදික පුද්ගලයා මාතලේ රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් පමණ වන යාචක පුද්ගලයෙකි.**

මෘත ශරීරය මාතලේ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ත්‍රීරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මාතලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. මාරක රිය අනතුරක් - තණමල්විල පොලිස් වසම.**

2025.11.08 වන දින අළුයම් කාලයේ තණමල්විල පොලිස් වසමේ තණමල්විල වැල්ලවාය මාර්ගයේ බලහරුව ප්‍රදේශයේදී වැල්ලවාය දෙස සිට තණමල්විල දෙසට ධාවනය වූ ටිපර් රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි වෑන් රථයක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ වෑන් රථ රියදුරු තණමල්විල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා හම්බන්තොට රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 45 ක් වූ තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හම්බන්තොට රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ටිපර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - වැලිකන්ද පොලිස් වසම.**

2025.11.08 වන දින සවස් කාලයේ වැලිකන්ද පොලිස් වසමේ අසේලපුර කුරුළුබැද්ද මාර්ගයේ අසේලපුර ප්‍රදේශයේදී කුරුළුබැද්ද දෙසට ධාවනය වූ ට්‍රැක්ටර් රථයක මාර්ගය හරහා ගමන් කල දරුවෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ එම දරුවා වැලිකන්ද රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 08 ක් වූ අසේලපුර ප්‍රදේශයේ පදිංචි දරුවෙකි.**

මෘත ශරීරය වැලිකන්ද රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ට්‍රැක්ටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - කොටවිල පොලිස් වසම.

2025.11.08 වන දින සවස් කාලයේ කොටවිල පොලිස් වසමේ කොටවිල ලැබීම මාර්ගයේ කඹුරුගමුව ප්‍රදේශයේදී කොටවිල දෙස සිට ලැබීම දෙසට ධාවනය වූ ට්‍රැක්ටර් රථයක ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක් ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරු ලැබීම රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 82 ක් වූ කොටවිල, කඹුරුගමුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මාතර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුරට සම්බන්ධ ට්‍රැක්ටර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. වැලිකන්ද පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**